**විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳ වන සංවාදය දේශපාලන සමාජය තුළ යළි නව වටයකින් ඇරඹී තිබේ. ඒ, ජනතා විමුක්ති පෙරමුණ විසින් විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා වන ව්‍යවස්ථා සංශෝධනයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පියවර ගැනීමත් සමඟිනි. ඒ සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මෙසේ අදහස් දැක්වූයේ කොළඹදී පැවැති සංවාද සභාවකදීය.**

# විධායක ජනාධිපති ධුරය සතු බලය කැත, මජර බලයක්. එය අහෝසි කළ යුතුයි.

**අනුර කුමාර දිසානායක**
**නායක-ජනතා විමුක්ති පෙරමුණේ**

අපි මේ ගෙන එන්නේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ සංශෝධනයක්. මේ රටේ සියලු ජනතාව යටත්වන මූලික නීතිය පිළිබඳ මේ සංශෝධනයට විවිධ අදහස් ඉදිරිපත් කිරීමේ අයිතියක් තිබෙන බව අපි පිළිගන්නවා. ඒ නිසා මෙය සංවාදයට භාජනය විය යුතුයි කියන එකත් අපි පිළිගන්නවා. ඒ සංවාදයේදී ව්‍යවස්ථාව මත, ව්‍යවස්ථාවේ පැනනඟින කරුණු මත, ඉදිරියේදී විය හැකි බලය පිළිබඳ ස්වභාවයන් මත කෙරෙන සාකච්ඡාවකට අපි විරුද්ධ නැහැ.

හැබැයි මීට අදාළ නැති බලහත්කාරී, ත්‍රාඩ කඳවුරක් එක්ක මේ ගැන සංවාදයක් නැති බවත් අපි පිළිගන්නවා. මොකද ඔවුන් සංවාදයෙන්, සාකච්ඡාවෙන්, තර්කනයෙන් තේරුම් ගන්නවා වෙනුවට දේශපාලන අරමුණක් වෙනුවෙන් පෙනී සිටින්නන් නිසා. අපේ රටේ අද තිබෙන දේශපාලන සංස්කෘතිය තුළ ජනාධිපතිවරයා සතුව තිබෙන බලය මන්ත්‍රීවරුන් විකිණෙන පාර්ලිමේන්තුවකට ලබා දිය යුතු ද කියන කරුණ ගැනත් විවාදයක් අපිට තිබෙනවා. ඒ විවාදයට ව්‍යවස්ථාව ඇතුළේ විසඳුම් තිබෙනවා කියලා අපි හිතන්නේ නැහැ. ඒ විවාදයට විසඳුම් තියෙන්නේ මේ දේශපාලන සංස්කෘතිය මහා පරිවර්තනයකට ලක් කිරීමෙන් පමණයි.

ව්‍යවස්ථාව ඇතුළේ යම් ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිසංස්කරණයන් ප්‍රමාණයක් අපේ රටේ ඉදිරි ගමනට අදාළව අත්පත් කර ගන්න පුළුවන් නම් එය ප්‍රගතිගාමී පියවරක්. අපේ රට මුහුණ දී තිබෙන ගැඹුරුතම අර්බුදයන් සඳහා විධායක ජනාධිපති ධුරය අහෝසි කළ පමණින් විසඳුම් ලැබෙනවාය කියන මිථ්‍යාවක අපි නැහැ. ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ශක්තිමත් කිරීමට ඉදිරිගාමී පිය වරයන් ගත යුතුයි. ඒ නිසා විසි වැනි සංශෝධනය ප්‍රජාතාන්ත්‍රික ආයතනයන් ශක්තිමත් කිරීමේ දිශාවටත් යොදා ගත හැකි බව අපි දකිනවා.

තනි අධිකාරිත්වයක් සතුව තිබෙන මේ අසීමිත බලය යම් සභාවන් වෙත පැවරිය යුතුව තිබෙනවා. කැබිනට් මණ්ඩලය සංවාද තුළින් තීරණ ගන්නවා යැයි මතයක් තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ විශාල සංවාදයන්ගෙන් තීරණ ගන්නවා යැයි මතයක් තිබෙනවා. දෙපැත්තේ තර්ක විතර්කවලට ඉතා හොඳින් ඇහුම්කන් දෙමින් තීරණ ගන්නවා යැයි සිතන අධිකරණයක් තිබෙනවා. එයින් යුක්තිය පසිඳලනවා යැයි කියල උපකල්පනයක් තිබෙනවා. මේවා ප්‍රජාතන්ත්‍රවාදය, ශිෂ්ටත්වය පවත්වාගෙන යාම වෙනුවෙන් පිහිටුවා තියෙන ආයතන. නමුත් මේ විධායක ජනාධිපති ධුරය විසින් මේ සියලු ආයතන සතු බලය ශූන්‍ය බවට පත් කර තිබෙනවා. කැබිනට් මණ්ඩලය, පාර්ලිමේන්තුව, අධිකරණය කියන පද්ධති බලශූන්‍ය ආයතන බවට පත් කර තිබෙනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් අමාත්‍යංශවල වැදගත්ම කොටස් විධායක බලය පාවිච්චි කරලා තමන් යටතට ගත්තා. තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යංශය සතු ටීආර්සී එක, ඉඩම් අමාත්‍යංශයේ ඉඩම් වැඩිපුරම තියෙන එල්ආර්සී එක, පරිසර අමාත්‍යංශයේ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ආදී වැදගත් විෂයන් ගණනාවක් පවරගෙන තිබුණේ මහින්ද රාජපක්ෂ. මොකද ඒ ආයතනවල තමයි වැඩිපුර මුදල් ගනුදෙනු සිදුවුණේ. ඊට අමතරව වැදගත්ම අමාත්‍යංශ තිබුණේ පවුල අතේ. වරාය ගුවන්තොටුපළ චමල් අතේ. මාර්ග සංවර්ධන මහින්ද අතේ. මේ විධායක බලය පාර්ලිමේන්තුව බල රහිත කරලා. ජේආර් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් හිස් කොලවලට අත්සන් ගත්තා ඉල්ලා අස්වීමේ ලිපි විදියට. ජනපති සහ මන්ත්‍රීවරුන් අතර විශාල පරතරයක් තිබෙනවා. පෞරුෂයක් ඇති මන්ත්‍රීවරුන් බිහිවෙන්නේ නැහැ. රාජපක්ෂ 18 සම්මත කර ගත්තේ එහෙම පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන්ගෙන්.

විශේෂයෙන්ම අපි දැක්කා ශිරාණි බණ්ඩාරනායක අගවිනිසුරුතුමිය නෙරපා හැරීමේ ක්‍රියාවලිය දියත් කළ ආකාරය. සාමාන්‍යයෙන් අධිකරණයේ ගරුත්වය වෙනුවෙන් නීතිඥ මහත්වරුන් පෙනී සිටිනවා. පාර්ලිමේන්තුවේත් මන්ත්‍රීවරුන් ලෙස නීතිඥවරුන් ගණනාවක් සිටිනවා. හැබැයි ශිරාණි බණ්ඩාරනායක මහත්මිය නෙරපා හැරීමේදී ආණ්ඩු පක්ෂයේ හිටපු එක නීතිඥ මන්ත්‍රීවරයෙක් ඊට විරුද්ධව අත එසෙව්වාද? ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරිය නෙරපා හැරීම කියන්නේ ක්ෂේත්‍රයට එල්ල කළ කුළුගෙඩි පහරක්. නමුත්, ඊට විරුද්ධව අත ඔසවන්න බැරි විධායකය විසින් පාර්ලිමේන්තුව පොඩිපට්ටම් කර තිබීමයි.

මහනුවර හිටපු එක්සත් ජාතික පක්ෂයේ කේශර සේනානායකට විරුද්ධව අල්ලස් කොමිසමෙන් පරීක්ෂණයක් පැවැත්වූවා. ඔහු ආරක්ෂාව පතා මහින්ද රාජපක්ෂගේ විධායක ජනාධිපති ධුරයේ සෙවනට ගියා. අවුරුදු දෙක හමාරක් නඩු අහලා, අවුරුදු දෙකක සිරදඬුවම් නියම වුණා. හැබැයි විධායක බලයේ සමාව දීමෙන් විත්ති කූඩුවෙන් බැහැලා ජීප් එකේ නැගලා ගෙදර ගියා. මිනීමරුවන්ට, ස්ත්‍රී දූෂකයින්ට විධායක ජනාධිපති සමාව දෙනවා.
මේ විධායක ජනාධිපති ධුරයේ බලය කියන්නේ කැත මජර බලයක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වැනි ජේදයේ 1 (ආ) යටතේ මෙහෙම තියෙනවා. "නියම කරන ලද යම් දඬුවමක් ක්‍රියාත්මක කිරීම කාලසීමාවක් නොමැතිව හෝ සුදුසු යැයි ජනාධිපතිවරයා කල්පනා කරන කාලසීමාවක් ඇතිව හෝ කල් ගැනීමට බලය තියෙනවා" ආදායම් බදු සම්බන්ධ නඩුවක දී අධිකරණයේ තීන්දුව වුණේ නියම කරන ලද මුදල ගෙවන ලෙසයි. නමුත් ජනාධිපතිවරයා අධිකරණ තීන්දුවට එරෙහිව ලබා දුන් තීන්දුව "ආදායම් බදු ගෙවිය යුතු නැත" කියලයි.
අධිකරණයේ තීන්දුව වුණේ යම් කාල සීමාවක් ඇතුළත ආදායම් බදු ගෙවන්න කියලයි. ඒක දඬුවමක් නෙමෙයි. එහෙම තියෙද්දි චන්ද්‍රිකා මැතිනිය සමාව දුන්නා ආදායම් බදු ගෙවන්න ඕන නැහැ කියලා.
ඉතින් මේ විධායකය යටතේ කැබිනට් මණ්ඩලය, පාර්ලිමේන්තුව, අධිකරණ පද්ධතිය වැඩක් තියෙනවා ද? විධායක බලය හමුවේ මේ පද්ධති මුළුමනින්ම සුනුවිසුණු කොට යටත් කර තියෙන්නේ. මේ කැත මජර බලය අහෝසි කළ යුතු නැද්ද? මන්ත්‍රීවරුන්ට වසර පහක් ගියාම විශ්‍රාම වැටුපක් ලැබෙනවා. නමුත් ජනාධිපතිවරයා එක දවසක් තනතුරේ හිටියොත් සියලු වරප්‍රසාද සහිතව විශ්‍රාම වැටුප, නිල නිවාස, ආරක්ෂක නිලධාරීන් සියල්ල ලැබෙනවා. ඒ විතරක් නෙවෙයි විශ්‍රාම වැටුප් දෙකක් ගැනීමටත් ව්‍යවස්ථාවෙන් අවස්ථාව හදලා තියෙනවා.

ඒ වගේම මන්ත්‍රීවරුන්ට වාහන පර්මිට් එකක් ලැබෙන හැම අවස්ථාවකම ජනාධිපතිවරයාට පර්මිට් එකක් ගන්න අයිතිය හදලා දීලා තියෙනවා. මෛත්‍රීත් ගත්තා. මන්ත්‍රීවරුන්ට පර්මිට් එක ලැබෙන හැම අවස්ථාවකම මහින්ද රාජපක්ෂත් එකක් ගත්තා. ඒ වගේම පාර්ලිමේන්තුවට බලය තිබෙනවා ජනාධිපතිවරයාගේ දීමනා වැඩි කරන්න. නමුත් අඩු කරන්න බැහැ. දීමනාවක් ගන්න ඕන නම් ඒක ගන්න එක වෙනම කාරණයක්. නමුත් මේවා ව්‍යවස්ථාවට ඇතුල් කරලා. ඒකයි අපි කියන්නේ මේක කැත මජර බලයක් කියලා. මේ බලය අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයට, පාර්ලිමේන්තුවට පැවරිය යුතුයි. එය තමයි යුක්තිසහගත වන්නේ. ගණ, ගෝත්‍ර ලෙස අපේ සමාජය කාලයක් පැවතුණා. ගෝත්‍රයේ නායකයා තමයි රැගේ සියලු තීරණ ගත්තේ. නමුත් සමාජ අරගලය නිසා සාමූහික තීන්දුතීරණ ගන්න තත්වයට පත්වුණා. නමුත් නැවත විධායක ජනාධිපතිධුරය ස්ථාපිත කිරීම අශිෂ්ටත්වයට යාමක්. එනිසා 20වැනි සංශෝධනය යනු ශිෂ්ටත්වය වෙනුවෙන් කෙරෙන අරගලයක්. 20ට එරෙහි වීම අශිෂ්ටත්වයයි. 20ට එරෙහිව පෙනී ඉන්න අය කවුද කියලා බැලුවාම ඒක හොඳට ජේනවා.

පසුගියදා නායක හාමුරුවන් වහන්සේලා කරුණු 16ක් රටට ඉදිරිපත් කළා. ඒ කරුණුවලින් විශාල ප්‍රමාණයක් 20වැනි සංශෝධනය සමඟ කිසිදු සම්බන්ධයක් නැහැ. ඇතැම් ඒවා උන්වහන්සේලාගේ හිතේ තිබෙන සංකල්පයන් පමණක් බව ගෞරවයෙන් මතක් කර දෙන්න ඕනෑ. 20වැනි සංශෝධනයට එරෙහිව පෙනී ඉන්න දේශපාලන කඳවුරට වන්දනා මාන කරන්න කුමන හෝ සුරුවමක් ඕනෑ. එනිසා ඔවුන්ට ජනාධිපතිවරයෙක් ලෙස තනි පුද්ගලයෙක් ඕනෑ. ඔවුන් නිවට නියාලු ලෙස වැඳවැටෙන්න කැමතියි. එනිසා ජනාධිපති ක්‍රමය රැකගන්න ඔවුන් උත්සාහ කරනවා. ඒ අයට ජනාධිපතිවරයෙක් පත්කරගැනීම වෙනුවෙන් දේශපාලන න්‍යාය පත්‍රයක් තිබෙනවා. අපි 20 සංශෝධනය දැම්මාම ඒක සම්පූර්ණයෙන්ම අවුල් වුණා. ඒ නිසා දැන් ඔවුන් කලබල වෙලා තිබෙනවා. මේ ස්වාමීන් වහන්සේලාට කරන්න තිබුණේ ඉදිරිපත් වී නොමැති 20වැනි සංශෝධනය ගැන කථා කරනවාට වඩා ඒ සම්බන්ධයෙන් අපි සමඟ සාකච්ඡාවක් කරන එකයි. ඒ සඳහා අපි අදටත් සූදානමින් ඉන්නවා.

මේ අය ගේන එක තර්කයක් තමයි 20 සම්මත වුණොත් 13 අනුව බලය බෙදනවා කියන එක. ඒක පට්ට පල් බොරුවක්. අපි ඔවුන්ට අභියෝග කරනවා පුළුවන්නම් බලය බෙදන හැටි කියන්න කියලා. චන්ද්‍රිකා බණ්ඩාරනායක, මහින්ද රාජපක්‍ෂ ඇතුළු සියලු දෙනා විධායක ජනාධිපති ධුරය

